# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.06.30 |

## කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 ජූනි මාසයේ දී සියයට 54.6ක් වශයෙන් වාර්තා විය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 39.1හි සිට 2022 ජූනි මාසයේ දී සියයට 54.6ක් දක්වා ඉහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය මෙලෙස ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික ඉහළ යෑම් හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 මැයි මාසයේ පැවති සියයට 57.4හි සිට 2022 ජූනි මාසයේ දී සියයට 80.1 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 මැයි මාසයේ පැවති සියයට 30.6හි සිට 2022 ජූනි මාසයේ දී සියයට 42.4 දක්වා ඉහළ ගියේය.

| උද්ධමනය | මැයි 2022 | ජූනි 2022 |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 195.2 | 220.2 |
| මාසික වෙනස (%) | 8.3 | 12.8 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 39.1 | 54.6 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 14.2 | 18.4 |
| **මූලික** | | |
| දර්ශක අගය | 182.9 | 200.2 |
| මාසික වෙනස (%) | 6.1 | 9.5 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 28.4 | 39.9 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 10.2 | 13.3 |

**කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




**කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




2022 ජූනි මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 12.80ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් පිළිවෙළින්, සියයට 6.81කින් සහ සියයට 5.99කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ආහාර කාණ්ඩය තුළ 2022 ජූනි මාසයේ දී, නැවුම් මත්ස්‍ය, එළවළු, පාන්, සහල් සහ කිරිපිටි මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, ආහාර නොවන කාණ්ඩය තුළ, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන (පෙට්‍රල්, ඩීසල්, පාසල් ප්‍රවාහන ගාස්තු සහ බස් ගාස්තු), ආපනශාලා සහ හෝටල්, අධ්‍යාපනය (ද්විතීයික අධ්‍යාපනය සඳහා වන උපකාරක පන්ති ගාස්තු), සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන (නඩත්තු/පිළිසකර කිරීම් සහ එල්.පී. ගෑස්) යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ ගියේය.

එමෙන්ම, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 14.2හි සිට 2022 ජූනි මාසයේ දී සියයට 18.4 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 28.4හි සිට 2022 ජූනි මාසයේ දී සියයට 39.9 දක්වා ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 මැයි මාසයේ පැවති සියයට 10.2හි සිට 2022 ජූනි මාසයේ දී සියයට 13.3 දක්වා ඉහළ ගියේය.

---

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2021 | ජූනි | 142.4 | 143.1 | 1.5 | 0.4 | 5.2 | 3.2 | 4.1 | 3.0 |
| | ජූලි | 143.1 | 144.1 | 0.5 | 0.7 | 5.7 | 3.7 | 4.2 | 3.1 |
| | අගෝස්තු | 143.5 | 144.6 | 0.3 | 0.3 | 6.0 | 4.1 | 4.3 | 3.2 |
| | සැප්තැම්බර් | 144.1 | 146.0 | 0.4 | 1.0 | 5.7 | 5.0 | 4.5 | 3.3 |
| | ඔක්තෝබර් | 146.9 | 147.9 | 1.9 | 1.3 | 7.6 | 6.3 | 4.8 | 3.6 |
| | නොවැම්බර් | 150.7 | 149.4 | 2.6 | 1.0 | 9.9 | 7.0 | 5.3 | 4.0 |
| | දෙසැම්බර් | 154.7 | 151.3 | 2.7 | 1.3 | 12.1 | 8.3 | 6.0 | 4.4 |
| 2022 | ජනවාරි | 158.4 | 154.1 | 2.4 | 1.9 | 14.2 | 9.9 | 6.9 | 5.0 |
| | පෙබරවාරි | 160.1 | 155.7 | 1.1 | 1.0 | 15.1 | 10.9 | 7.9 | 5.7 |
| | මාර්තු | 164.9 | 159.4 | 3.0 | 2.4 | 18.7 | 13.0 | 9.1 | 6.5 |
| | අප්‍රේල් | 180.2 | 172.4 | 9.3 | 8.2 | 29.8 | 22.0 | 11.3 | 8.1 |
| | මැයි | 195.2 | 182.9 | 8.3 | 6.1 | 39.1 | 28.4 | 14.2 | 10.2 |
| | ජූනි | 220.2 | 200.2 | 12.8 | 9.5 | 54.6 | 39.9 | 18.4 | 13.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව